// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1871/42 - 2014 ජූලි මස 18 වැනි සිකුරාදා - 2014.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 33/1973.

### ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 8 වන සහ 29 වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 82අ වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

අබ්දුල් රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2014 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2014 අංක    දරන බෙදුම් නඩු (මැනීම් සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගයේ I වන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු අනුප්‍රමාණ ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත ප්‍රකාරව බෙදුම් නඩුවකට අදාළව සිදු කරනු ලබන මුල් මැනීමක් සම්බන්ධයෙන් අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ විය යුතු ය.

3. මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු අනුප්‍රමාණ ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත ප්‍රකාරව බෙදුම් නඩුවකට අදාළව සිදු කරනු ලබන අවසාන මැනීමක් සම්බන්ධයෙන් අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණයන් විය යුතු ය.

4. 1996 අගෝස්තු මස 15 වන දින අංක 936/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මගින් සහ 2005 අගෝස්තු මස 15 වන දින අංක 1406/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මගින් සංශෝධිත පරිදි වූ 1995 දෙසැම්බර් මස 1 වන දින අංක 889/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1995 අංක 1 දරන මිනුම් ගාස්තු නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

1A - PG 2113— 350 (2014/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1 වන උපලේඛනය

(2 වන නියෝගය)

**මුල් මැනීමක් සඳහා අයකළ හැකි ගාස්තු අනුප්‍රමාණ**

| 1 වැනි තීරය<br>මුල් මැනීමට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ විස්තර | 11 වැනි තීරය<br>අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ |
|---|---|
| 1. පාර්ශවකරුවන් වෙත ලියාපදිංචි තැපැලෙන් දැන්වීම් නිකුත් කිරීම | දැන්වීමකට රුපියල් 20/-ක් සහ ලිපි ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු |
| 2. වාචික ප්‍රකාශය කරන තැනැත්තකුට ගෙවිය යුතු වේතන හා ගමන් වියදම් | රුපියල් 2,500/-ක් සහ ස්ථානයට යාම සඳහා සහ එහි සිට ආපසු ඒම සඳහා බස් ගාස්තු |
| 3. මැනීම සිදු කරන ලද්දේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම- | |
| (අ) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහ නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්, | වර්ග මීටර් 250 දක්වා රුපියල් 10,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 100 සඳහා රුපියල් 1,000ක් |
| (ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ සීමාව තුළ පිහිටා ඇත්නම්,<br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවා ඇති ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් බල ප්‍රදේශයක හෝ යම් බලපත්‍රලත් කලාපයක් තුළ පිහිටා ඇත්නම්. | වර්ග මීටර් 250 දක්වා රුපියල් 7,500ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 500 සඳහා රුපියල් 1,000ක් |
| (ඇ) (i) (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්,<br>(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්<br>(ඉහත සඳහන් මැනීම්, සැලසුම් සකස් කිරීම සහ වාර්තා ලබාදීම, අනුපිටපත් ලබාදීම, සැලසුම මත අධිස්ථාපනය කිරීම මගින් උපබෙදුම් පෙන්නුම් කිරීම, සැලසුම් සංවර්ධන සහ භූ ලක්ෂණ පෙන්නුම් කිරීම ඇතුළත් වේ.) | වර්ග මීටර් 1,000 දක්වා රුපියල් 6,000ක් සහ එක් එක් වැඩිවන වර්ග මීටර් 250 සඳහා රුපියල් 750/- |

1 වන උපලේඛනය (සම්බන්ධිතයි )

*(2 වන නියෝගය)*

**මුල් මැනීමක් සඳහා අයකළ හැකි ගාස්තු අනුප්‍රමාණ**

| *1 වැනි තීරය*<br>*මුල් මැනීමට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ විස්තර* | *11 වැනි තීරය*<br>*අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ* |
|---|---|
| 4. සහයකයන් සඳහා ගෙවන වේතන | |
| (අ) පුහුණු සහයකයා සඳහා | රුපියල් 1,500/- |
| (ආ) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,200/- |
| එසේ වුව ද, පුහුණු සහයකයා ද ඇතුළුව සහයකයන් ප්‍රමාණය හත්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 5. මිනින්දෝරුවරයාගේ කටයුතුවල පාලනයට පරිබාහිර අවස්ථානුකූල කරුණු හේතුවෙන් දිනයක් ඇතළත මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකිවන අවස්ථාවක දී පහත දැක්වෙන ගාස්තු අයකරනු ලැබිය හැකි ය. | |
| (අ) මිනින්දෝරුවරයාගේ වෘත්තීය ගාස්තුව | රුපියල් 4,000/- |
| (ආ) පුහුණු සහයකයා සඳහා | රුපියල් 1,500/- |
| (ඇ) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,200/- |
| එසේ වුව ද, පුහුණු සහයකයා ද ඇතුළුව සහයකයන් ප්‍රමාණය හත්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 6. මිනින්දෝරුවරයාගේ වෘත්තීය ගාස්තු | සාක්ෂි ලබාදීම ඇතුළුව සියලු කාර්ය සඳහා සහභාගීවීම වෙනුවෙන් දිනකට රුපියල් 4,000/- |
| 7. මැනීමක් සඳහා වූ අවම ගාස්තුව | වර්ග මීටර් 2000 දක්වා රුපියල් 10,000/- සහ අතිරේක එක් එක් වර්ග මීටර් 1,000 සඳහා රුපියල් 2,500/- |
| 8. 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද වැල්ලවත්ත, කිරුලපන සහ දෙහිවල යන ප්‍රදේශවල කැඩැස්තර සිතියම සකස් කිරීම සඳහා | පිළිවෙලින් ඉහත 1 සිට 5 දක්වා සඳහන් වූ අයිතමවලට අතිරේක 40%ක අතිරේක ගෙවීමක් |
| 9. බාධා පැමිණීම සහ අවහිර කිරීම හේතුවෙන් මිනින්දෝරුවරයාට මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වන අවස්ථාවක දී පහත දැක්වෙන ගාස්තු අනුප්‍රමාණ අයකරනු ලැබිය හැකි ය : | |
| (අ) මිනින්දෝරුවරයාගේ වෘත්තීය ගාස්තු | රුපියල් 4,000/- |
| (ආ) පුහුණු සහයකයා සඳහා | රුපියල් 1,500/- |
| (ඇ) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,200/- |

II වන උපලේඛනය

(*3 වන නියෝගය*)

**අවසාන මැනීම සඳහා අයකළ හැකි ගාස්තු අනුප්‍රමාණ**

| *1 වැනි තීරය*<br><br>*අවසාන මැනීමට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ විස්තර* | *11 වැනි තීරය*<br><br>*අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ* |
|---|---|
| 1. පාර්ශවකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීම් නිකුත් කිරීම | දැන්වීමකට රුපියල් 20/-ක් සහ ලිපි ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු |
| 2. වාචික ප්‍රකාශය කරන තැනැත්තකුට ගෙවිය යුතු වේතන හා ගමන් වියදම් | රුපියල් 2,500/-ක් සහ ස්ථානයට යාම සඳහා සහ එහි සිට ආපසු ඒම සඳහා ගමන් ගාස්තු |
| 3. මැනීම සිදු කරන ලද්දේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම : | |
| (අ) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහ නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්, | වර්ග මීටර් 250 දක්වා රුපියල් 10,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 100 සඳහා රුපියල් 1,000ක් |
| (ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයේ සීමාව තුළ පිහිටා ඇත්නම්,<br><br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවා ඇති ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් බල ප්‍රදේශයක හෝ යම් බලපත්‍රලත් කලාපයක් තුළ පිහිටා ඇත්නම් | වර්ග මීටර් 250 දක්වා රුපියල් 7,500ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 500 සඳහා රුපියල් 1,000ක් |
| (ඇ) (i) (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්,<br><br>(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්<br><br>(ඉහත සඳහන් මැනීම් සඳහා, සැලසුම් සකස් කිරීම හා වාර්තා ලබාදීම, අනුපිටපත් ලබාදීම, සැලසුම මත අධිස්ථාපනය කිරීම මගින් උපබෙදුම් පෙන්නුම් කිරීම, සැලසුමෙහි සංවර්ධන යන හු ලක්ෂණ පෙන්නුම් කිරීම ඇතුළත් වේ.) | වර්ග මීටර් 1,000 දක්වා රුපියල් 6,000ක් සහ එක් එක් වැඩිවන වර්ග මීටර් 250 සඳහා රුපියල් 750/- |

II වන උපලේඛනය (සම්බන්ධිතයි )

(*3 වන නියෝගය*)

**අවසාන මැනීම සඳහා අයකළ හැකි ගාස්තු අනුප්‍රමාණ**

| *I වැනි තීරය*<br>*අවසාන මැනීමට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ විස්තර* | *II වැනි තීරය*<br>*අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ* |
|---|---|
| 4. සහයකයන් සඳහා ගෙවන වේතන- | |
| (අ) පුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,500/- |
| (ආ) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,200/- |
| එසේ වුව ද, පුහුණු සහයකයා ද ඇතුළුව සහයකයන් ප්‍රමාණය හත්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 5. මිනින්දෝරුවරයාගේ කටයුතුවල පාලනයට පරිබාහිර අවස්ථානුගත කරුණු හේතුවෙන් දිනයක් ඇතුළත මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකිවන අවස්ථාවක දී පහත දැක්වෙන ගාස්තු අයකරනු ලැබිය හැකි ය. | |
| (අ) මිනින්දෝරුවරයාගේ වෘත්තීය ගාස්තුව | රුපියල් 4,000/- |
| (ආ) පුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,500/- |
| (ඇ) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රුපියල් 1,200/- |
| එසේ වුව ද, පුහුණු සහයකයා ද ඇතුළුව සහයකයන් ප්‍රමාණය හත්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 6. මිනින්දෝරුවරයාගේ වෘත්තීය ගාස්තු | සාක්ෂි ලබාදීම ඇතුළුව සියලු කාර්ය සඳහා සහභාගී වීම වෙනුවෙන් දිනකට රුපියල් 4,000/- |
| 7. මැනීම් කටයුතු පවත්වාගෙන යෑම සඳහා- | |
| (අ) මුල් මැනීමේ සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත මුල් මැනීම සිදුකළ මිනින්දෝරුවරයා වෙත ම අධිකාර පත්‍රය නිකුත්කර ඇත්නම් | මුල් මැනීම සිදුකිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුවෙන් හරි අඩක් (1/2) |
| (ආ) මුල් මැනීමේ සිට එක් අවුරුද්දක කාලයකින් පසුව මුල් මැනීම සිදුකළ මිනින්දෝරුවරයා වෙත ම අධිකාරී පත්‍රය නිකුත්කර ඇත්නම් | මුල් මැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුවෙන් හතරෙන් තුනක් (3/4) |
| (ඇ) අධිකාරී පත්‍රය නිකුත්කර ඇත්තේ වෙනත් මිනින්දෝරුවරයකුට නම්, කාලසීමාව නොසලකමින් | මුල් මැනීම සිදුකිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු අනුප්‍රමාණය |
| 8. (අ) කැබලි වෙන් කිරීමේ සැකැසුමක් සකස් කිරීම | පළමු කැබලි 10 සඳහා රුපියල් 4,000/-ක් සහ අතිරේක එක් එක් කැබැල්ලක් සඳහා රුපියල් 250/- |

II වන උපලේඛනය (සම්බන්ධිතයි )

(3 වන නියෝගය)

**අවසාන මැනීම සඳහා අයකළ හැකි ගාස්තු අනුප්‍රමාණ**

| 1 වැනි තීරය<br>අවසාන මැනීමට අදාළව සිදු කරන ලද වැඩ පිළිබඳ විස්තර | 11 වැනි තීරය<br>අය කළ හැකි ගාස්තු අනුප්‍රමාණ |
|---|---|
| (ආ) බිමෙහි කැබලි වෙන් කිරීම් සටහන් කිරීම ; | |
| (i) වර්ග මීටර් 500 දක්වා වූ කැබැල්ලක් සඳහා | රුපියල් 1,000/- |
| (ii) වර්ග මීටර් 1,000 දක්වා වූ කැබැල්ලක් සඳහා | රුපියල් 1,250/- |
| (iii) වර්ග මීටර් 2,000 දක්වා වූ කැබැල්ලක් සඳහා | රුපියල් 1,500/- |
| (iv) වර්ග මීටර් 4,000 දක්වා වූ කැබැල්ලක් සඳහා | රුපියල් 2,000/- |
| (v) වර්ග මීටර් 4,000 වැඩි කැබැල්ලක් සඳහා | රුපියල් 2,500/- |
| 9. වන්දි ගෙවීමේ හෝ සම කිරීමේ කාර්යය සඳහා භූමියේ, වැවිලිවල සහ ගොඩනැගිලිවල සහ අනිකුත් ඉදිකිරීම්වල සහ වැඩි දියුණු කිරීම්වල ද වටිනාකම තක්සේරු කිරීම සඳහා ගාස්තුව ; | |
| (i) 1 වැනි තලය සඳහා | රුපියල් 50,000/- 1% රුපියල් 500/- ; |
| (ii) 2 වැනි තලය සඳහා | රුපියල් 50,000/- 3/4% රුපියල් 375/- ; |
| (iii) 3 වැනි තලය සඳහා | රුපියල් 50,000/- 1/2% රුපියල් 250/- ; |
| (iv) 4 වැනි තලය සඳහා | රුපියල් 50,000/- 1/4% රුපියල් 125/- ;<br>රුපියල් 200,000/- රුපියල් 1,250/- ; |
| (v) රුපියල් 200,000 වැඩිනම් | ඇගයීම් සඳහා 1/8% |
| 10. ඇගයීම් උපලේඛනය සහ බෙදා දීම පිළිබඳ සාරාංශය පිළියෙල කිරීම | පළමු බිම් කැබලි හතර සඳහා රුපියල් 250/- සහ අතිරේක එක් කැබැල්ලක් සඳහා රුපියල් 150/- |

08-213

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.